# වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය

## ව්‍යාපෘති කළමනාකරණ ඒකකය

## බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ සංවර්ධන ව්‍යාපෘතිය අදියර II - පියවර 2

## පුරප්පාඩු (කොන්ත්‍රාත් පදනම මත)

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ (BIA) සංවර්ධන ව්‍යාපෘතිය යනු ගුවන් සේවා කර්මාන්තයේ වර්ධනය වන ඉල්ලුමට සරිලන පරිදි ගුවන්තොටුපළ පහසුකම් නවීකරණය හා පුළුල් කිරීම අරමුණු කරගත් සුවිශේෂී වැඩසටහනකි. ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය (JICA) විසින් අරමුදල් සපයන මෙම ව්‍යාපෘතියට, අති නවීන පහසුකම්වලින් සමන්විත නව පර්යන්ත ගොඩනැගිල්ලක් ඉදිකිරීම ඇතුළත් වේ. මෙම ව්‍යාපෘතියට පර්යන්තය පමණක් නොව, ජපන් ඉංජිනේරු උපදේශන සේවාවන් සමඟ යාන්ත්‍රික, විදුලි සහ ජලනළ (MEP), තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සහ සිවිල් ඉංජිනේරු ඉදිකිරීම් ඇතුළු ඊට සම්බන්ධිත සියලුම කාර්යයන් අයත් වේ.

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ 2026.03.28 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 2/2026 ට අනුකූලව, කටුනායක BIA හි ඉහත ව්‍යාපෘතියේ පහත සඳහන් තනතුරු සඳහා ශ්‍රී ලාංකික සුදුසුකම්ලත්, ක්‍රියාශීලී පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### 1. ව්‍යාපෘති අධ්‍යක්ෂ - තනතුරු 01

**සුදුසුකම් : (පහත i හෝ ii)**

i. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථමඋපාධියක්.

සහ

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් (මාස්ටර්ස්) / අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වයක් / සමාන වෘත්තීය සුදුසුකමක්

සමඟ

කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 12 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්දක්, ඉන් වසර 06 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.

ii. අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආයතනික/ අධිසාමාජිකත්වය

සමඟ

අදාළ ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 10 ක පළපුරුද්දක්, ඉන් වසර 05 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය.

**වැටුප :** කාණ්ඩය-A - රු. 400,000/- සහ රජය විසින් අනුමත කරන ලද දීමනා.

### 2. ව්‍යාපෘති කොන්ත්‍රාත් විශේෂඥ - තනතුරු 01

**සුදුසුකම් : (පහත i හෝ ii)**

i. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධියක්

සහ

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් (මාස්ටර්ස්) / අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වයක් හෝ සමාන වෘත්තීය සුදුසුකමක්

සමඟ

අදාළ ක්ෂේත්‍රයේ කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් වසර 10 ක පළපුරුද්දක්.

ii. රජයේ දීප ව්‍යාප්ත සේවයේ I පන්තියේ නිලධාරියෙකු හෝ අදාළ ක්ෂේත්‍රයේ ඊට සමාන තත්ත්වයක්

සහ

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි (මාස්ටර්ස්) සුදුසුකමක්

සමඟ

අදාළ ක්ෂේත්‍රයේ I පන්තියේ තනතුරක හෝ ඊට සමාන තත්ත්වයක අවම වශයෙන් වසර 03 ක පළපුරුද්දක්.

**වැටුප :** කාණ්ඩය C (විශේෂඥ කාණ්ඩය) - රු. 305,000/- සහ රජය විසින් අනුමත කරන ලද දීමනා.

### 3. සිවිල් ඉංජිනේරු - තනතුරු 02

### 4. විදුලි ඉංජිනේරු - තනතුරු 01

### 5. ඉලෙක්ට්‍රොනික් ඉංජිනේරු - තනතුරු 01

### 6. යාන්ත්‍රික ඉංජිනේරු - තනතුරු 01

**සුදුසුකම් : (පහත i හෝ ii)**

i. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක්/ අදාළ ක්ෂේත්‍රයේ උපාධියකට සමාන සුදුසුකමක්

සහ

අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වයක් / ඊට සමාන වෘත්තීය සුදුසුකමක්

සමඟ

අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 07 ක පළපුරුද්දක්.

ii. රජයේ දීප ව්‍යාප්ත සේවයේ II/III පන්තියේ හෝ ඊට ඉහළ නිලධාරියෙකු හෝ අදාළ ක්ෂේත්‍රයේ ඊට සමාන තත්ත්වයක්

සහ

අදාළ ක්ෂේත්‍රයේ II/III පන්තියේ තනතුරක හෝ ඊට සමාන තත්ත්වයක අවම වශයෙන් වසර 07 ක පළපුරුද්දක්.

**වැටුප :** කාණ්ඩය - D - රු. 260,000/- සහ රජය විසින් අනුමත කරන ලද දීමනා.

### 7. ව්‍යාපෘති ගණකාධිකාරී - තනතුරු 01

### 8. ව්‍යාපෘති අභ්‍යන්තර විගණක - තනතුරු 01

**සුදුසුකම් : (පහත i, ii හෝ iii)**

i. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් / අදාළ ක්ෂේත්‍රයේ උපාධියකට සමාන සුදුසුකමක්

සහ

Licentiate II අන්තර් මධ්‍ය විභාගය / සහතිකපත්‍ර II ගිණුම්කරණය සහ ව්‍යාපාර / ව්‍යාපාර මට්ටමේ විභාගය/ ආයතනික මට්ටමේ විභාගය හෝ වරලත් ගණකාධිකාරී ආයතනයේ ඉහළ විභාගයක් හෝ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ඊට සමාන වෘත්තීය සුදුසුකමක් සමත් වීම

සමඟ

අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 07 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්දක්.

ii. අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වයක්/ ඊට සමාන වෘත්තීය සුදුසුකමක්

සමඟ

අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 04 ක පළපුරුද්දක්.

iii. රජයේ දීප ව්‍යාප්ත සේවයේ II/III පන්තියේ හෝ ඊට ඉහළ නිලධාරියෙකු හෝ අදාළ ක්ෂේත්‍රයේ ඊට සමාන තත්ත්වයක්;

සමඟ

අදාළ ක්ෂේත්‍රයේ II/III පන්තියේ තනතුරක හෝ ඊට සමාන තත්ත්වයක අවම වශයෙන් වසර 07 ක පළපුරුද්දක්.

**වැටුප :** කාණ්ඩය -D-1 - රු. 260,000/- සහ රජය විසින් අනුමත කරන ලද දීමනා.

### 9. ගිණුම්කරණ සහකාර - තනතුරු 01

**සුදුසුකම් : (පහත i හෝ ii)**

i. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක්/ අදාළ ක්ෂේත්‍රයේ උපාධියකට සමාන සුදුසුකමක්

හෝ

තනතුරේ තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළව, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් පිළිගනු ලැබූ තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් මඟින් නිකුත් කරන ලද, NVQ මට්ටම 7 ට නොඅඩු නිපුනතා සහතිකයක්

සහ

අදාළ විශේෂඥ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 03 ක පළපුරුද්දක්.

ii. තනතුරේ තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළව, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් පිළිගනු ලැබූ තාක්ෂණික/වෘත්තීය පුහුණු ආයතනයක් මඟින් නිකුත් කරන ලද, NVQ මට්ටම 6 ට නොඅඩු නිපුනතා සහතිකයක්

සහ

අදාළ විශේෂඥ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 06 ක පළපුරුද්දක්.

iii. තනතුරේ තාක්ෂණික ක්ෂේත්‍රයට අදාළව, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) විසින් පිළිගනු ලැබූ තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයක් මඟින් නිකුත් කරන ලද, NVQ මට්ටම 5 ට නොඅඩු නිපුනතා සහතිකයක්

සහ

අදාළ විශේෂඥ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 09 ක පළපුරුද්දක්.

**වැටුප :** කාණ්ඩය - F - රු. 160,000/- සහ රජය විසින් අනුමත කරන ලද දීමනා.

### 10. ලඝුලේඛක ලිපිකරු (Steno Clerk) - තනතුරු 03

**සුදුසුකම් : (පහත i සහ ii)**

i. අ.පො.ස (උසස් පෙළ) විභාගයේදී එකවර විෂයයන් 03 ක් සමත් වී තිබීම.

ii. සිංහල / දෙමළ, ඉංග්‍රීසි භාෂා, ගණිතය සහ වෙනත් විෂයයන් දෙකක් සඳහා සම්මාන සාමාර්ථ සමඟ එකවර විෂයයන් හයකින් අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම.

### 11. කාර්යාල සහකාර - තනතුරු 03

**සුදුසුකම් : (පහත i සහ ii)**

i. වාර දෙකකට නොවැඩි ගණනකදී සිංහල / දෙමළ ඇතුළුව අවම වශයෙන් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථ සමඟ විෂයයන් හයකින් (06) අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගය සමත්වී තිබීම.

ii. පරිගණක සාක්ෂරතාවය සහ කාර්යාල සහකාරවරයෙකු ලෙස පළපුරුද්ද අමතර සුදුසුකමක් වනු ඇත.

iii. ගම්පහ දිස්ත්‍රික්කයේ පදිංචිකරුවන් සඳහා ප්‍රමුඛත්වය ලබා දෙනු ලැබේ.

**වැටුප් :**

01 සිට 09 දක්වා තනතුරු සඳහා, 2026.03.28 දිනැති මුදල්,ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ,කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු (MSD)චක්‍රලේඛ අංක 02/2026 ප්‍රකාරව රජය අනුමත කළ සියලුම දීමනා හිමිවේ. 10 සහ 11 තනතුරු සඳහා MSDචක්‍රලේඛ අංක 02/2026 ප්‍රකාරව සහ අදාළ රාජ්‍ය පරිපාලන වැටුප් පරිමාණය (MN-2, Grade III සහ PL-1, Grade III) සමඟ ආරම්භක පියවරේ 50% දීමනාවක් සහ අනෙකුත් රජයේ දීමනා හිමිවේ.

**වයස :**

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට, 1,2,3,4,5,6,7,8, සහ 9 තනතුරු සඳහා වයස අවුරුදු 64 නොඉක්මවිය යුතුය.

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට,10 සහ 11 තනතුරු සඳහා වයස අවුරුදු 45 නොඉක්මවිය යුතුය.

**අමතර පළපුරුද්ද / සුදුසුකම් (ප්‍රමුඛත්වය දෙනු ලැබේ) :**

පහත සුදුසුකම් සපුරා ඇති අය සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ඇත

- විදේශ අරමුදල් සහිත ව්‍යාපෘති පිළිබඳ පළපුරුද්ද.
- තනතුර 2 සඳහා : හිමිකම් පෑම් සමාලෝචනය (review of claims), ප්‍රතිචාර සකස් කිරීම, කොන්ත්‍රාත් ප්‍රතිපාදන අර්ථ නිරූපණය කිරීම ආදිය පිළිබඳ නිපුනතාවය.
- පිළිගත් වෘත්තීය ආයතනයක සාමාජිකත්වය.
- ඉංජිනේරුවන් සඳහා: Microsoft Office මෘදුකාංග පැකේජ පිළිබඳ හුරුපුරුදු බව සහ AutoCAD සහ MS Project හෝ ඊට සමාන මෘදුකාංග පිළිබඳ නිපුනතාවය.
- තනතුර 5 සඳහා : ගොඩනැගිලි සහ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිවල තොරතුරු තාක්ෂණ (IT), ඉලෙක්ට්‍රොනික් සහ ELV පද්ධති පිළිබඳ පළපුරුද්ද.
- ජාත්‍යන්තර ගුවන්තොටුපළ ආශ්‍රිත ඉදිකිරීම් ව්‍යාපෘති පිළිබඳ පළපුරුද්ද.

**සාමාන්‍ය තොරතුරු :**

- සේවකයා වැටුපෙන් 8% ක් සේවක අර්ථසාධක අරමුදලට (EPF) දායක විය යුතු අතර, සේවායෝජකයා විසින් 12% ක් EPF වෙතද 3% ක් සේවක භාරකාර අරමුදලට (ETF) ද දායක කරනු ඇත.

**සේවා නියුක්ති කොන්දේසි :**

ව්‍යාපෘති කාර්ය මණ්ඩලය වසරක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලබන අතර, සතුටුදයක කාර්ය සාධනය මත වාර්ෂිකව අලුත් කළ හැක.

**සේවා ස්ථානය :**

ව්‍යාපෘති කළමනාකරණ ඒකකය,

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ සංවර්ධන ව්‍යාපෘතිය අදියර - II පියවර 2
මිනුවන්ගොඩ පාර, නයිකන්ද,
කටුනායක.

**අයදුම්පත් :**

අධ්‍යාපනික, වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද සහිත ජීව දත්ත සටහන (CV) සහ ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ සම්බන්ධතා තොරතුරු සමඟ, **2026 අගෝස්තු 12** දිනට හෝ ඊට පෙර, **ලේකම්, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය, අංක 19, චෛත්‍ය පාර, කොළඹ 01** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම් කරන තනතුර කවරයේ වම් පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය. සහතිකවල පිටපත් අයදුම්පතට අමුණා තිබිය යුතුය.

කාන්තා අයදුම්කරුවන් අයදුම් කිරීමට දිරිමත් කරනු ලැබේ.

රාජ්‍ය / අර්ධ රාජ්‍ය අංශයේ අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානීන් හරහා අයදුම්පත් එවිය යුතුය.

**සුදුසුකම් සහ පළපුරුද්ද මත කෙටි ලැයිස්තුගත කරනු ලබන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.**

**ලේකම්,**
**වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය,**
**අංක 19, චෛත්‍ය පාර,**
**කොළඹ 01.**